ආකෘති පත්‍ර (අංක 01)

පාර්ලිමේන්තු සැසි අංකය 114
ආයතනයේ නම අමාත්‍ය මණ්ඩල කාර්යාලය

| කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතාවය | දුර්වලතාවය මහහරවා ගැනීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගය/වර්තමාන තත්වය |
|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපැවැත්වීම | මෙම කාර්යාලය සඳහා වෙන් කරනු ලබන අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය අනෙකුත් රාජ්‍ය ආයතන හා සසඳන කළ ඉතාමත් සුළු ප්‍රමාණයක් වීමත්, වෙනත් රාජ්‍ය ආයතනවල මෙන් විවිධ ව්‍යාපෘති හෝ වැඩසටහන් මෙම කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු නොලැබීමත් යන කරුණු හේතුවෙන් මෙම කාර්යාලය සඳහා අතිරේක වියදමක් දරමින් අභ්‍යන්තර විගණක තනතුරක් පැවතීමේ දැඩි අවශ්‍යතාවක් නොපවතින බව මවිසින් විගණනය වෙත අවස්ථා ගණනාවකදී කරුණු ඉදිරිපත් කරන ලද නමුත් විගණනය විසින් එකී කරුණු සමඟ එකඟ නොවීම හේතුවෙන් මෙම කාර්යාලය සඳහා අභ්‍යන්තර විගණක තනතුරක් අලුතින් ඇති කිරීම සඳහා පියවර ගන්නා ලදී. එකී තනතුර සඳහා සුදුසු නිලධාරියෙකු පූර්ණකාලීන පදනම් මත බඳවා ගනු ලබන තෙක් මුදල් අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීනියක් වැඩබැලීම සඳහා පත් කිරීම පිණිස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගනු ලැබුවද දැනට මෙම කාර්යාලයේ පවතින ඉඩකඩ එකී නිලධාරිනියට අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවන බැවින් මෙතෙක් අභ්‍යන්තර විගණක කටයුතු මෙම කාර්යාලය තුළ සිදු කිරීමට හැකි වී නොමැති අතර අදාල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසිපරිදි පැවැත්වීමට නොහැකි වූ බව පෙන්වා දෙනු කැමැත්තෙමි. මෙම කාර්යාලය වඩාත් ඉඩකඩ සහිත වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමෙන් අනතුරුව එම නිලධාරිනියට අවශ්‍ය පහසුකම් සලසා දීමට තීරණය කරන ඇත. |
| භාණ්ඩ සමීක්ෂණ කටයුතු | 2017 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිසි පරිදි පත් කරනු ලැබ තිබූ අතර විගණිත දින වන විට එම මණ්ඩලය විසින් සිය වාර්තාව සකස් කිරීමේ අවසන් අදියරේ කටයුතු සිදු කරමින් පැවතුනි.වාර්තාව සකස් කර 2018.05.03 දින විගණකාධිපතිවරයා වෙත යොමු කර ඇත. අඛිලි/භාවිතයට ගත නොහැකි භාණ්ඩ අපහරණය කිරීම සම්බන්ධ වාර්තාව 2018.08.08 දින විගණකාධිපතිවරයා වෙත යොමු කර ඇත. |
| සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගැනීම | 2017 දෙසැම්බර් මාසයට අදාල එහෙත් ගෙවීම් වලට අදාල ලේඛන 2017 දෙසැම්බර් 31 දින වන විට ලැබී නොතිබුණු පහත සඳහන් වන අත්‍යාවශ්‍යයෙන්ම දැරිය යුතු වියදම් සඳහා 2018 වර්ෂය මුලදී ගෙවීම් කර ඇත. 1003(වෙනත් දීමනා)වැය විෂය යටතේ රු.231,019.69, 1101(දේශීය ගමන් වියදම්) වැය විෂය යටතේ රු.4,932.75 ක් හා 1402(තැපැල් හා සන්නිවේදන) වැය විෂය යටතේ රු.29,220.16 ක් මෙලෙස බැඳීම් ලෙස ඇතිකර ගෙන තිබුණි. |

එස්.අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්

එස්. අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්,
අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ජනරජ චතුරශ්‍රය,
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත
කොළඹ 01